කම්කරු අමාත්‍යාංශය
தொழில் அமைச்சு
**MINISTRY OF LABOUR**

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

| මගේ අංකය / எனது இல / My No. | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date |
|---|---|---|
| ML/ES/5/2/1/ස්ථාන මාරු | DL/E/01/03/2022 | 2021.11. 24 |

කම්කරු කොමසාරිස්වරුන්
නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්
සහකාර කම්කරු කොමසාරිස්වරුන්

**කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් - 2022**
**- සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර**

කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) සේවයේ නිලධාරීන් සඳහා 2022 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අයදුම්පත් කැඳවනු ලැබේ. ස්ථාන මාරු වීම් අපේක්ෂා කරන 2021.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) සේවයේ නිලධාරීන් මේ සමඟ ඇති වාර්ෂික ස්ථාන මාරු වීම් අංක 01 ආකෘති පත්‍රය සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව මා වෙත එවිය යුතුය. ආයතන ප්‍රධානි නිර්දේශ රහිත ස්ථානමාරු ඉල්ලීම් ස්ථාන මාරු මණ්ඩලයේදී සලකා බලනු නොලැබේ.

02. එමෙන්ම, වත්මන් සේවා ස්ථානයේ වසර 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් හා එක් කලාපයක් තුල වසර 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු වීම් වලට යටත් වන බැවින් ස්ථාන මාරුවක් ඉල්ලුම් නොකරන්නේ වුවද එම සියලුම නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු වීම් අංක 03 ආකෘති පත්‍රය අනිවාර්යයෙන්ම සම්පූර්ණ කර මා වෙත එවිය යුතුය.

03. මේ සම්බන්ධයෙන් ඔබ අංශයේ / කාර්යාලයේ සේවයේ නියුතු සියලුම සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) සේවයේ නිලධාරීන් දැනුවත් කර අයදුම්පත් 2021.12.07 දිනට පෙර කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. එසේම, නියමිත දිනයට පසුව ලැබෙන ස්ථාන මාරු අයදුම්පත් සහ ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ගේ අයදුම්පත් ස්ථාන මාරු මණ්ඩල වෙත ඉදිරිපත් නොකරන බවද අවධාරණය කරමි.

04. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබනුයේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය (උදා :- 2022 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා 2021.12.31 දිනය). සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධාරයාගේ පාලනයෙන් බැහැර කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබඳව සැලකිල්ලට යොමු කරයි. තවද, නිලධාරියාගේ පාලනයෙන් බැහැර හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.

05. කම්කරු දෙපාර්තමේන්තුවෙහි දෙපාර්තමේන්තුගත සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරනු ලැබූ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ඇමුණුම 01 මඟින් සියළු නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

06. 2013.05.31 දිනැතිව අනුමත කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටියේ 06 වන ඡේදයේ දැක්වෙන වාර්ෂික

11/24



ලේකම්/செயலாளர்/Secretary : +94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / secretary@labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk

ස්ථාන මාරු කාලසීමාව වර්තමානයේ රටෙහි පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වසරට සීමා වන පරිදි (2022 වර්ෂය) පහත පරිදි සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| නොවැම්බර් 25 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම් පිළිබඳ දැන්වීම නිකුත් කිරීම |
| දෙසැම්බර් 07 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර කම්කරු කොමසාරිස් ජනරාල් මඟින් අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම |
| දෙසැම්බර් 14 දිනට පෙර | - | අයදුම්පත්‍ර වාර්ෂික ස්ථාන මාරු කමිටු වෙත භාරදීම |
| දෙසැම්බර් 31 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව භාර දීම |

07. මෙලෙස අනුමත ස්ථාන මාරු කාලසටහන සංශෝධනය කිරීමට සිදුවූයේ රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා ඇඳිරි නීතිය පැනවීම මත සීමිත සේවක පිරිසක් කාර්යාලය සඳහා කැඳවීම යනාදී කරුණු නිසාවෙන් බව සඳහන් කරන අතර, 2023 වසරේ සිට නියමිත පරිදි අනුමත මාරුවීම් පටිපාටිය අනුගමනය කිරීමට අපේක්ෂිත බවද වැඩිදුරටත් සඳහන් කරමි.

එම් පී ඩී යූ කේ මාපා පතිරණ
ලේකම්

ආකෘති අංක 01

# සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ අයදුම් පත්‍රය

01. පෞද්ගලික තොරතුරු

1.1 නම (පත්වීම් ලිපියේ පරිදි) : ..........................................................

1.2 නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..........................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................

1.5 මුල් පත්වීම් දිනය : ..........................................................

1.6 පෞද්ගලික ලිපිනය : ..........................................................

..........................................................

1.7 දුරකථන අංකය : නිවස : .............................. ජංගම : ..............................

02. වර්තමාන සේවා ස්ථානය

2.1 කාර්යාලය : ..........................................................

2.2 කාර්යාලීය ලිපිනය : ..........................................................

..........................................................

2.3 කාර්යාලීය දුරකථන අංකය : ..........................................................

03. තනතුර

3.1 තනතුරට පත් වූ දිනය : ..........................................................

04. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව : ..........................................................

..........................................................

..........................................................

05. පූර්ව සේවා ස්ථාන

| අනු අංකය | සේවා ස්ථානය | කාල සීමාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

06. ස්ථාන මාරු ඉල්ලුම් කරන සේවා ස්ථාන

| අනු අංකය | සේවා ස්ථානය |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවට සහතික කරමි. මා විසින් ස්ථාන මාරු ලැබීමට ඉල්ලා ඇති ඕනෑම සේවා ස්ථානයකට/එම ස්ථාන වලට ඉතා ආසන්න ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමැත්ත මින් පළකරන බවත් එම ඉල්ලීම මත, ලබා දෙන ස්ථාන මාරුව සඳහා නියෝග නිකුත් කළ පසු එම නියෝග අවලංගු කිරීමට හිමිකමක් නොමැති බවත් පිළිගනිමි.

දිනය : ..............................

..............................

අත්සන

## වත්මන් සේවා ස්ථානයේ වසර 05කට වැඩි/කලාපයක වසර 10කට වැඩි කාලයක් සේවය කර ඇති සහකාර කම්කරු කොමසාරිස්වරුන් විසින් සම්පූර්ණ කලයුතු අයදුම් පතුය

01. පෞද්ගලික තොරතුරු

1.1 නම (පත්වීම් ලිපියේ පරිදි) : ..............................

1.2 නම වෙනස් කර ඇත්නම් එම නම මුලකුරු සමඟ : ..............................

1.3 සම්පූර්ණ නම : ..............................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

1.5 මුල් පත්වීම් දිනය සහ තනතුර : ..............................

1.6 වර්තමාන තනතුරට පත් වූ දිනය : ..............................

1.7 පෞද්ගලික ලිපිනය : ..............................

..............................

1.8 දුරකථන අංකය : නිවස : .................... ජංගම : ....................

02. වර්තමාන සේවා ස්ථානය

2.1 කාර්යාලය : ..............................

2.2 සේවා ස්ථානයේ රාජකාරියට වර්තා කළ දිනය : ..............................

2.2 කාර්යාලීය ලිපිනය : ..............................

..............................

2.3 කාර්යාලීය දුරකථන අංකය : ..............................

03. වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කර තිබේද? : ..............................

04. පූර්ව සේවා ස්ථාන

| අනු අංකය | සේවා ස්ථානය | කාල සීමාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

05. වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවීමක් ලැබුනහොත් සේවය කිරීමට කැමති සේවා ස්ථාන

| අනු අංකය | සේවා ස්ථානය |
|---|---|
| 01 | |
| 02 | |
| 03 | |

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

දිනය : ....................

..............................

අත්සන

ඇමුණුම 01

20 - I
23 - I
6

මගේ අංකය : ML/ES/7/1/1-II
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
තැ:පෙ: 1519, දෙවන මහල කම්කරු,
මහලේකම් කාර්යාලය නාරාහේන්පිට,
කොළඹ 05.
2013.05 31

**කම්කරු දෙපාර්තමේන්තුවෙහි දෙපාර්තමේන්තුගත සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය**

01. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009-02-20 දිනැති 1588/30 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව කම්කරු දෙපාර්තමේන්තුවෙහි දෙපාර්තමේන්තුගත සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය.

02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන්

2.1 මේ වන විට දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින දෙපාර්තමේන්තුගත සහකාර කම්කරු කොමසාරිස්වරුන් අතුරින්,

2.1.1 යම් සේවා ස්ථානයක වසර පහක් (05) ඉක්මවා සේවය කර ඇති, සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමට අපේක්ෂිත නිලධරයන්.

2.1.2 එක් කලාප කාර්යාලයක් තුළ උපරිම සේවා කාලය වසර දහයක් (10) සම්පූර්ණ කර ඇති නිලධරයන්.

03. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි වන්නේය.

I.) අතිරේක ලේකම් (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය)
II.) කම්කරු කොමසාරිස් (පාලන)
III.) දෙපාර්තමේන්තුමය කම්කරු කොමසාරිස්වරුන්ගේ සංගමයේ නියෝජිතයෙක්

04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

I) අතිරේක ලේකම් (කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය)
II) කම්කරු කොමසාරිස් (පාලන)
III) කම්කරු කොමසාරිස්වරයෙකු

05. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සළකා බැලිය යුතු පොදු කරුණු

5.1 මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී සේවා අවශ්‍යතාවයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

5.2 වාර්ෂික ස්ථාන මාරු වීම් වලදී කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය. (උදා :- 2012 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2011.12.31 දිනය)

5.3 වාර්ෂික ස්ථාන මාරු වීම් වලදී සේවා කාලය ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි මස පළමු වන දිනයයි. නමුත් නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය විෂයයක් හේතුවෙන් සේවයට වාර්තා කළ දිනය පසු දිනයක් වේ නම් මාරු මණ්ඩල ඒ පිළිබඳව සැළකිල්ල යොමු කරයි.

5.4 සේවා කාලය ගණන් ගැනීමේදී කලාපය තුළ කුමන දිස්ත්‍රික් කාර්යාලයක සේවය කළද එම කාල වල මුළු එකතුව කලාපය තුළ සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

5.5 අංක 2 යටතේ සඳහන් කර ඇති කාල සීමාවට අඩු අවම වශයෙන් එක් සේවා ස්ථානයක වසර තුනක් සම්පූර්ණ කර ඇති නිලධරයන්ටද මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේ ස්ථාන මාරු වීම් ඉල්ලුම් කළ හැකිය.

5.6 පහසු සේවා ස්ථානයක නියම සේවා කාලය සම්පූර්ණ නොකරන ලද නිලධරයෙක් දුෂ්කර සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි ස්ථාන මාරුවක් ලැබීමට සුදුසු වන්නේය.

5.7 සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය.

06. වාර්ෂික ස්ථාන මාරු කාලසටහන.

| | | |
|---|---|---|
| ජූනි මස 30 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිලිබඳව දැන්වීම නිකුත් කිරීම |
| ජූලි මස 31 දිනට පෙර | - | අමාත්‍යාංශ ලේකම් වෙත වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර භාර දීම. |
| අගෝස්තු මස 15 දිනට පෙර | - | අමාත්‍යාංශ ලේකම් වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර ආදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාර දීම. |
| අගෝස්තු මස 31 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත ලිඛිතව භාර දීම. |

| | | |
|---|---|---|
| සැප්තැම්බර් මස 15 දිනට පෙර | - | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කිරීම. |
| සැප්තැම්බර් මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටු පත්කිරීම. |
| ඔක්තෝබර් මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත භාර දීම. |
| නොවැම්බර් මස 01 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම. |
| ජනවාරි මස 01 වැනි දින සිට | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක වේ. |

07. ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙනලද නියමයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් , එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි අංක 23 පරිශිෂ්ඨයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේය. තව ද, තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමටද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2. රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළයුතු වන්නේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් මඟින් වන අතර , එම අභියාචනයේ පිටපතක් අදාල පරිදි ආයතන ප්‍රධාන , කම්කරු කොමසාරිස් ජනරාල් හා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් වෙත ද යොමු කළයුතු වන්නේය තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්ගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් විසින් කරන ලද ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළ දී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාල සියලු ලිපි ගොනු, ලිපිලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධාන, කම්කරු කොමසාරිස් ජනරාල්, පත්කිරීම් බලධරයා හා කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශයේ ලේකම්වරයා වග බලා ගතයුතු වන්නේය. එසේවුවද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටියක රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපි ගොනු, ලිපි ලේඛන, වාර්තා, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ දෙසැම්බර් මස 01 වැනි දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරන ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 21 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15ක් ඇතුලත, ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල් හා ආයතන ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම

අදාළ ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සහ අභියාචනා අයදුම්පත් චක්‍රලේඛයෙහි සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර කම්කරු කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්.ජේ.එල්.යූ. විජයවීර
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යංශය